# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,192 — 1936ක්වූ ජනවාරි මස 10 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Anuradhapura No. 175.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සතු ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1936ක්වූ පෙබරවාරි මස 24වෙනි දිනවූ සඳුදා පෙරවරු 10ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යොදනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරගම්කෝරළේ නුවරගම් පලාතේ නුවරකලාවිය කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 37ක්.

මුල් සිත්යමේ නො. අයි. ඇස්. පී. පී. 1. ගම—කුඩාවැව. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 21 | නොච්චිමඩුමුකලාන .. | අනුරාධපුරේ පදිංචි වේලුපුලේ මානික්කම් | කුඹුර .. | 10 | 0 | 2 | 30* |
| | | ගම—කලුවිල. | | | | | |
| 40 | ඉඹුලගස්යාය .. | අනුරාධපුරේ පදිංචි වේලුපුල්ලෙ රාසිය .. | එම .. | 12 | 1 | 18 | 30* |
| 89 | එම .. | එම .. .. | වත්ත .. | 4 | 1 | 36 | 30 |
| 92 | එම .. | පන්ඩතෙරිප්පුවේ මානගල් පදිංචි ජෝසප් අන්තෝනි පුල්ලෙ සෙල්ලම්මා | එම .. | 4 | 0 | 31 | 30 |
| 95 | එම .. | තම්මැන්නාකුලමේ පදිංචි එදිරිසිංහ මොහොට්ටිගෙ බාරොන් සරම් අප්පුහාමි | එම .. | 6 | 1 | 7 | 30 |
| 96B | එම .. | එම .. .. | කුඹුර .. | 9 | 3 | 16 | 30* |
| 305 | කොලොන්ගස්ඉඩම .. | (1) පහලවැවේ පදිංචි පුලියදේවයලගෙ කිරී, (2) ඔහිසගෙ පිනා, (3) බටගොඩලෙ වී. ඇම්. ඇස්. ස්කෝලේ පදිංචි ජේ. රත්නායක නෝනා සහ වෙයන්ගොඩ උඟුරපල පදිංචි මෝදරගෙ විලියම් පෙරේරා | එම .. | 4 | 0 | 6 | 30* |
| | | ගම—අතුරුවෙල. | | | | | |
| 368 | අතුරුවෙලකටුපොක .. | කුසව පදිංචි හෙයිහ මහම්මදු පිච්චෙතම්බි සහ හෙයිහ මහම්මදු මොහිදීන් තම්බි | එම .. | 2 | 3 | 1 | 30* |
| | | මුල් සිතියමේ නො. අයි. ඇස්. පී. පී. 2. ගම—හග්ගමුව. | | | | | |
| 5A | හග්ගමුවකැලේ .. | ආලන්කුලමෙ පදිංචි ඇස්. සුවාරිස් අප්පු | පොල්වගාකරපුඉඩම | 3 | 0 | 27 | 40* |
| | | ගම—ආලන්කුලම. | | | | | |
| 24 | ආලන්කුලමකැලේ .. | මීගොඩ ස්ටේෂන් මාස්ටර් කේ. සෙල්ව දොරෙයි | කුඹුර සහ වතු ඉඩම | 5 | 1 | 5 | 30* |
| $24\frac{1}{2}$ | එම .. | එම .. .. | එම | 4 | 3 | 3 | 30* |
| 25 | එම .. | එම .. .. | එම .. | 3 | 2 | 33 | 30 |
| $25\frac{1}{2}$ | ආලන්කුලමකුඹුර සහ ආලන්කුලමවත්ත | එම .. .. | එම .. | 1 | 2 | 22 | 30* |
| $25\frac{1}{2}$B | ආලන්කුලමකුඹුර .. | එම .. .. | එම .. | 0 | 2 | 16 | 30* |
| $25\frac{1}{3}$ | ආලන්කුලම්කැලේ .. | එම .. .. | එම .. | 2 | 2 | 8 | 30* |


3——J. N. 51931—137 (1/36)

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මනන, අ. | රූ. | ප. | අක්කරයක මිල,රු. |
|---|---|---|---|---|---|---|---|
| | | ගම—මහරත්මලේ. | | | | | |
| 76½ | මහරත්මලේකැලේ .. | අනුරාධපුරේ පදිංචි ඒ. ඇල්. ඇම්. හනීපා | කුඹුර සහ වතුඉඩම .. | 6 | 3 | 13 | 30* |
| 79 | එම .. | එම .. .. | එම .. | 5 | 3 | 30 | 30* |
| 79½ | එම .. | එම .. .. | එම .. | 2 | 3 | 4 | 30* |
| 87 | එම .. | රත්මලේ පදිංචි ඩී. බී. ජේ. විජේරත්න .. | එම .. | 6 | 2 | 11 | 30* |
| 89 | එම .. | එම .. .. | එම .. | 5 | 3 | 1 | 30* |
| 190½A | මහරත්මලේකැලේ .. | අනුරාධපුරේ පදිංචි වීරකතිඝාර් සුබ්‍රමනියම් | කුඹුර .. | 2 | 3 | 30 | 30* |
| 191½A | එම .. | රත්මලේ පදිංචි එච්. ඇම්. පුන්චිබණ්ඩ .. | එම .. | 2 | 0 | 0 | 30* |
| | | ගම—ආමනේ. | | | | | |
| 358 | ආමනේකැලේ .. | ඇම්. ඇම්. සේක්කමරික්කාර් සහ තවත් 5 දෙනෙක් | කුඹුර සහ වතුඉඩම .. | 14 | 2 | 21 | 30* |
| 358A | එම .. | එම .. .. | එම .. | 1 | 1 | 14 | 30* |
| | | මුල් සිතියමේ නො. අයි. ඇස්. පී. පී. 3. ගම—තුරුවිල. | | | | | |
| 150D | හෙන්ඇලඉඩම .. | තුරුවිල පදිංචි හවඩියගෙ බන්ඩිය .. | කුඹුර .. | 3 | 2 | 27 | 30* |
| 152B | තුරුවිලකැලේ .. | එම .. .. | අල්ලාගෙන තිබෙන ඉඩම | 0 | 2 | 29 | — |
| 153I | තුරුවිලමූකලාන නොහො ත් හෙන්ඇලඉඩම | එම .. .. | කුඹුර සහ වතුඉඩම .. | 0 | 1 | 4 | 30* |
| 177G | තුරුවිලමූකලාන .. | අනුරාධපුරේ පදිංචි පී. පී. එච්. ජෝන් සිල්වා | කුඹුර .. | 10 | 2 | 18 | 30* |
| | | ගම—හිඹෝගම. | | | | | |
| 187 | හිඹෝගමමූකලාන් නොහොත් දිවුල්වැවකැලේ | නැසීගිය පී. ඒ. කෙනෙත්හාමිගෙ උරුමක්කාරයාවන අනුරාධපුරේ පදිංචි බබිලිච්. මරතේලිස් අප්පු | කුඹුර සහ වතුඉඩම .. | 5 | 2 | 0 | 30* |
| | | ගම—දිවුල්වැව. | | | | | |
| 251D | දිවුල්වැවකුඹුර .. | පයිසාගල පොතුවිල පදිංචි ඇම්. ඩොන්. පීරිස් අප්පුහාමි | කුඹුර .. | 1 | 1 | 4 | 30* |
| 251H | එම .. | වැල්වැටිතුරේ පුලිකන්දේ පදිංචි කේ. ඇස්. කන්දවානම් | එම .. | 1 | 3 | 27 | 30* |
| | | ගම—තුරුවිල. | | | | | |
| 284B | තුරුවිලකැලේ .. | තුරුවිල පදිංචිවසිට නැසීගිය බබිලිච්. ජුවන්අප්පුහාමිගෙ භාර්‍යාවන කිරීමැනිකා | කුඹුර සහ වතුඉඩම .. | 3 | 1 | 4 | 30* |
| 284C | එම .. | පොසින්චිපේදුරුතුඩුවේ තුම්පලෙයි පදිංචි වී. සිවප්‍රකාසම් | කුඹුර .. | 1 | 3 | 34 | 30* |
| 287D | කටුපොතකැලේ .. | උලුක්කුලමේ පදිංචි ජේ. ජිනදාස .. | එම .. | 4 | 2 | 1 | 30* |
| 287F | එම .. | තුරුවිල පදිංචි උක්කුවවෙදගෙ පුසුඹා සහ තවත් කෙනෙක් | එම .. | 3 | 3 | 26 | 30* |
| 289B | තුරුවිලකුඹුර .. | අනුරාධපුරේ පදිංචි ඇස්. මුත්තුවේලු .. | එම .. | 3 | 0 | 0 | 30* |
| 294 | කටුපොතකැලේ .. | තුරුවිල පදිංචි ඒ. ජී. මැනික්රාල සහ තවත් 31 දෙනෙක් | එම .. | 79 | 3 | 14 | 30* |

අයි. ඇස්. පී. පී. 1 ප්ලෑනේ නො. 21, 40, 89, 92, 95 සහ 96B දරන බිම්කට්ටි භාවිචදුව යටතේ විශෙෂ බදුබප්පු පිට දීතිබෙනවත්හැර අනිකුත් සියලුම බිම්කට්ටි විගොවිතැන පිණිස අවසරපත්‍රපිට බදුදී තිබේ. මෙකී ඉඩම් කෑබලි සියල්ලම බදුකාරයින්ට බේරුම්කරනු ලැබේ.

* මේ ඉඩම්වලට භාවිචදුව වැව යටතේ අවුරුද්දට රුපියල් 4 බැගින් දියබදු ගෙවිය යුතුය. මේ ආණ්ඩුවට උවමනා වූවිටක වෙනස්කලහැකිය.

ඉහතකී ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ උතුරුමධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1936ක්වූ ජනවාරි මස 4වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

රජසන්තක රබර් ඉඩම් බදුදීමයි.

මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල රබර් ගස්වල කිරි කපා ප්‍රයෝජන ගැනීම සඳහා අවුරුද්දක බද්ද මේ 1936ක්වූ පෙබරවාරි මස 17වෙනි දින පෙරවරු 10ට සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් රත්නපුර කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මේ සම්බන්ධව හෝ කුපන් ලබාගැනීම ගැනවත් කිසිම දේකට ඒජන්ත උන්නාන්සේ විසින් වගකියනු නොලැබේ.

3. අවුරුද්දේ බදුමුදල වෙන්දේසිය අවසානවූ වහාම ගෙවිය යුතුයි. එසේම බදුබප්පුවක්ද ලබාගත යුතුයි.

4. ඉඩම කැලෑවට යන්ට නොදී තබාගැනීමට බදුකාරයා වගකිය යුතුයි.

5. උවමනා කරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමෙ පස් සෝදා යෑම වැළැක්විය යුතුයි.

6. ඒජන්ත උන්නාන්සේගේ බලය ඇති සම කෙනෙකුට බද්ද අවසානයේදී බදුකාරයා විසින් ඉඩම නිරවුල්ව භාරදිය යුතුයි.

7. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැක.

8. 1. 36.
රත්නපුරේ කච්චේරියේදීය.

ඒ. අර්. හැලොක්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

ඉඩම්වල තොරතුරු.

| නො. | කෝරලය. | ගම. | ඉඩම්වල විස්තර. | බිම්ප්‍රමාණය, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කුරුවිටි .. | ඔඩුගල .. | නො. 343 දරණ සිතියමේ නො. 189–I සහ 189J දරණ බිම්කට්ටි .. | 3 | 1 | 31 |
| 2 | එම .. | එම .. | නො. 343 දරණ සිතියමේ නො. 156–I, 156J, 156G, 156F දරණ බිම්කට්ටි | 9 | 0 | 8 |
| 3 | එම .. | කිරිපෝරුව .. | නො. 50 දරණ සිතියමේ නො. 89AP දරණ බිම්කට්ටිය .. | 1 | 1 | 26 |
| 4 | එම .. | තෙප්පනාව ඉහල ගම | නො. 279 දරණ සිතියමේ නො. 11A සහ 11D දරණ බිම්කට්ටි .. | 6 | 3 | 33 |
| 5 | එම .. | පහලකන්ද .. | නො. 324 දරණ සිතියමේ නො. 19A, 19B, 19C, 19D සහ 9D දරණ බිම්කට්ටි .. | 5 | 1 | 29 |
| 6 | කුකුල් .. | අයගම .. | නො. 42 දරණ සිතියමේ නො. 88A දරණ බිම්කට්ටිය .. | 0 | 3 | 17 |

No. 11,648, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1936ක්වූ අප්‍රේල් මස 1වෙනි දිනවූ බදාදා පෙරවරු 9ට වගකොව්විටේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට හොහොත් වෙන අනුවකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මාතලේ පලාතේ උතුරු මාතලේ කෝරළයේ උඩුගොඩ පල්ලේසියපත්තුවේ කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 26ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 98. ගම—වගකොව්විටේ.

| නො. | ඉඩමේ නම. | ඊල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | මහන, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 106 | කලුගල .. | දෙමටගොඩ චාර්ලස් පෙරේරා විසින් අල්ලාගෙන තිබෙන බිම්කට්ටිය | පොල්වත්ත .. .. | 0 | 0 | 3 |
| 118 | කලුගලමුකලාන .. | එම .. .. | එම .. | 0 | 0 | 17 |
| 283½ | හෝනාමුඩයාගේවත්ත | දුල්ලෑවේගෙදර ක්‍රිස්තියන්අප්පු .. | එම සහ අඩිපාරට වෙන්කර තිබෙන බිම්කට්ටිය | 0 | 0 | 6* |
| 287½ | එම .. | අස්සිරීගේගෙදර පේදුරුඅප්පු විසින් අල්ලාගෙනතිබෙන බිම්කට්ටිය | පොල්වත්ත සහ අඩිපාරට වෙන් කරතිබෙන බිම්කොටස | 0 | 0 | 4* |
| 379 | එම .. | සමරකෝන්ගෙදර ජුවන් අප්පු සහ අන්තෝනි අප්පු | පොල්වත්ත සහ ගම්සභාපාරට ඇරතිබෙන බිම්කට්ටිය | 0 | 0 | 1* |
| 380 | එම .. | මැටියන්පොතගෙදර පේදුරුඅප්පු විසින් අල්ලාගෙනතිබෙන බිම්කොටස | එම .. | 0 | 0 | 12* |
| 382 | පිහිල්ලේයාගේවත්ත. | හැසිකිය හේනයාලාගේගෙදර උක්කුරිදී විසින් අල්ලාගෙන තිබෙන බිම්කොටස, (2) හේනයාලාගේගෙදර අප්පුවා, (3) එම මසිනා | පොල්වත්ත සහ ගම්සභාපාරට හැරතිබෙන බිම්කොටස | 0 | 0 | 9* |
| 437½ | අඹගස්හේනේවත්ත .. | දුල්ලෑවේගෙදර අගොස්තිනාහාමි, (2) කොහොඹගෙදර පේදුරුඅප්පු සහ තවත් අයවල් | පොල්වත්ත සහ ගම්සභාපාරට ඉතිරිකරතිබෙන බිම්කොටස | 0 | 0 | 3* |
| 438½ | එම .. | තුම්පනේගෙදර මර්තීනුඅප්පු .. | පොල්වත්ත සහ ගම්සභාව පාරට සහ අඩිපාරටත් ඉතිරි කරතිබෙන බිම්කොටස | 0 | 0 | 12* |
| 438⅓ | එම .. | එම .. .. | පොල්වත්ත සහ ගම්සභාපාරට ඉතිරිකරතිබෙන බිම්කට්ටිය | 0 | 0 | 5* |
| 451 | එම .. | සමරකෝන්ගෙදර මිගෙල්අප්පු විසින් අල්ලාගෙනතිබෙන බිම්කොටස | පොල්වත්ත .. | 0 | 0 | 19* |
| 452 | එම .. | එම .. .. | පොල්වත්ත සහ ගම්සභාපාරට ඉතිරිකරතිබෙන බිම්කොටස | 0 | 0 | 9* |
| 581 | ගල්ගොඩයාගේ වත්ත | බෝවත්තේගෙදර පෙමියානුඅප්පු .. | පොල්වත්ත .. | 0 | 1 | 27 |
| 582 | ගල්ගොඩ යාගේ මැවලතවත්ත | බෝවත්තේගෙදර ජුවන්අප්පු .. | එම .. | 0 | 2 | 27 |
| 595½ | ගල්ගොඩයාගේ වත්ත | සමරකෝන්ගෙදර වලෙන්තිනුඅප්පු .. | පොල්වත්ත, ගම්සභාපාරට ඉතිරිකරතිබෙන බිම්කොටස | 0 | 0 | 6* |
| 597½ | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 4* |
| 598 | ගල්ගොඩයාගේවත්ත | තුම්පනේගෙදර නිකුලස්අප්පු .. | පොල්වත්ත සහ ගම්සභාපාරට ඉතිරිකර තිබෙන බිම්කොටස | 0 | 0 | 6* |
| 608 | මොරතේපිල්ලෑව .. | පිටියේගෙදර අන්තෝනිඅප්පු .. | හේන, පාරට ඉතිරිකර තිබෙන බිම්කට්ටිය | 0 | 0 | 14* |
| 609 | මොරතිකුඹුරේපිල්ලෑව | හෙට්ටිආරච්චිගේ විල්බට් පෙරේරා හොහොත් චාලි, (2) අස්සිරිගෙදර ඉසබෙලාහාමි | එම .. | 0 | 0 | 11* |
| 647 | කැන්දගහ පිල්ලෑවේ හේන | කොළඹගෙදර පේදුරුඅප්පු, වෙල්විදානේ .. | හේන, මහපාරට ඉතිරිකර තිබෙන බිම්කොටස | 0 | 0 | 7* |
| 651 | කැන්දගහපිල්ලෑවේ වත්ත | සමරකෝන්ගෙදර මොසිසෙස්අප්පු විසින් වැට කන්ඩියෙන් අල්ලාගෙන තිබෙන කොටස | පොල්වත්ත .. | 0 | 0 | 6* |
| 653 | එම .. | සමරකෝන්ගෙදර මෙසියස්අප්පු .. | මහපාරට ඉතිරිකර තිබෙන බිම්කොටස | 0 | 0 | 11* |
| 657 | මොරගහපිල්ලෑවේ වත්ත | කොහොඹගෙදර මර්තීනුඅප්පු, (2) එම මරිලියානු, (3) එම ෆ්‍රොලෙන්තිනා | පොල්වත්ත සහ මහපාරට ඉතිරිකරතිබෙන බිම්කොටස | 0 | 0 | 8* |
| 660 | කැන්දගහපිල්ලෑවේ වත්ත | මැටියන්පොනේගෙදර බර්නාඩුඅප්පු එම බස්තියන්අප්පු | පොල්වත්ත, මහපාරට ඉතිරිකර තිබෙන බිම්කොටස | 0 | 0 | 20* |
| 687 | ගල්පොතමුල්ලේවත්ත | තුම්පනේගෙදර ජුවන්අප්පු, (2) එම පේදුරුඅප්පු (3) එම ජුසේඅප්පු | මහපාරට ඉතිරිකර තිබෙන බිම් කොටස | 0 | 0 | 5* |
| 690 | ගල්හෙල්පොතේමුල්ලේවත්ත | තුම්පනේගෙදර අන්තෝනිඅප්පු, (2) එම මර්තීනුඅප්පු, (3) එම අගොස්තිනාහාමි, (4) එම පව්සතියාහාමි | එම .. | 0 | 0 | 6* |

* බදුදීමට පමණයි.

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැණ මැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1935ක්වූ දෙසැම්බර් මස 7වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—53වෙනි හැතැප්ම කනුවේ කැන්දම්ගොමුවේ පැල්මඩුල්ලේ පාරේ ලිදක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876කේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබිතිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 342. ගම—හිඳල්ලන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 190 | හල්ගස්හේනේවත්ත හොහොත් අඹගහවත්ත | වත්ත .. | මින්තන්ති පෙරේරා, කහවත්ත | .. 0 0 5·3 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1936ක්වූ පෙබරවාරි මස 8වෙනි දින උදේ 10යේ කනිසමට රත්නපුර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1936ක්වූ ජනවාරි මස 3වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇත්. ජේ. ලඩින්ටන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—95යේ පැල්මඩුල්ලේ–හල්පේ පාරේ හැතැප්ම කනුවලය පාලම දිවුනුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. 595 ගම—පම්බින්න.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 106 | හිරිකටුඹයවත්ත | .. මුඹුබිම | .. එච්. කිරිනේරිස් සහ තවත් අය | .. 0 0 5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1936ක්වූ පෙබරවාරි මස 11වෙනි දින උදේ 10යේ කනිසමට බෙලිහුල්ඔය තානායම්පලදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගනනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1936ක්වූ ජනවාරි මස 7වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇත්. ජේ. ලඩින්ටන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බලංගොඩ ප්‍රසිඩ වැසිකිලියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 112. ගම—බලංගොඩ.

| නො. | ඉඩමේනම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බෝගහවත්තේ කොටසක් | .. වත්ත | .. සී. ඇල්. ඇම්. මරික්කාර් සහ තවත් අය | .. 0 0 4·02 |
| 2 | එම | .. එම | .. එම | .. 0 0 1·67 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1936ක්වූ පෙබරවාරි මස 12වෙනි දින උදේ 10යේ කනිසමට බලංගොඩ ගමන් බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1936ක්වූ ජනවාරි මස 7වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇත්. ජේ. ලඩින්ටන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වම්හ.

---

## ටැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක ඉඩම්වල අවුරුද්දක්තුළ මැණික් හෑරීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින්භාරගනුලැබේ.

2. "Tender for the Right to Gem" එනම් "මැණික් හෑරීමේ බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇත්වී ලොප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1936ක්වූ ජනවාරි මස 24වෙනි දින පෙරවරු 10.30ට වනතුරු භාරගණිමින් සඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරවන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගත්තාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවෙලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. ඉල්ලීම භාරගත් දින සිට මාස තුනක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් බදු අවසරපත්‍රයක් ලබානොගත්තොත් නම් ඔහු විසින් ගෙවනලද මුදල රජසන්තක වෙනවා ඇත.

5. බද්ද වලංගු කාලය තුළ බදුදෙන්ට යෙදුන ඉඩමේ ඇති ගස්වලට යම් අලාභයක් සිදුවෙන්ට හෝ නැතිනම් ඉදිරිවැටෙන්ට යෙදුනොත් එකී ගස්වල වටිනාකම බදුකාරයා විසින් ගෙවිය යුතුයි.

6. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේද, ඉල්ලුම්පත්‍රයක යම් කොටසක් භාරගැනීමේද බලය සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නාලදී.

7. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයන් විසින් තම තමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල පතල් ගොඩකිරීමාදියට සහ අවසරපත්‍රයේ කොන්දේසි කඩකිරීම වැලැක්වීමටත් සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරන්ට යෙදෙනලද රුපියල් සියයකට (රු. 100) වැඩිනොවන මුදලක් එක එක ඉඩමට ඇප වශයෙන් කච්චේරියේ බඳින්ට ඕනෑය.

8. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

9. ඉඩම් ඉල්ලුම්කාරයෝ තමතමන් ඉල්ලුම්කරණලද ඉඩම්වල වැඩ පටන්ගන්නා දින සහ වැඩ නවත්වන දිනද කොළඹ ලෝහ පරීක්‍ෂකතුමා වෙත දැන්විය යුතුයි. තවද එකී ලෝහ පරීක්‍ෂකතුමා පතල් විභාගයට ආවිට සියලුම පතල්වල වැඩ නවත්වා පරීක්‍ෂාකිරීමට ඉඩදිය යුතුයි.

10. වැඩිදුර කාරණ සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැකිවේ.

ඉඩම්වල තොරතුරු.

(1) අටකලන්කෝරළේ හන්ගමුගහ නොහොත් ගංගොඩ දෙල නැති දෙලේ මැද පිහිටි දූගොඩැල්ල නමැති දූවේ දිගින් දම්වැල් 3ක්ද, පලලින් යාර 6ක්ද සහ හතරැස් යාර 400ක් පමන බිම් ප්‍රමානයද ඇති සෑම පැත්තෙන්ම හංගමුගහ නොහොත් ගංගොඩදෙලවේ.

(2) නවදුන්කෝරළේ උඩපත්තුවේ බම්බරබොටුවේ නො. 3 දරන වොපෝ සිතියමේ නො. 1ක් බිම්කට්ටියේ වලවේ ගඟ ඉස්මත්තේ ගවරවිලලග පිහිටි අක්කර 4ක් පමන විශාලකම ඇති ඉඩමට මායිම:—

උතුරට: මද්දියම පලාතේ ගම්මායිම.
නැගෙනහිරට සහ දකුණට: කෝදුරුගල තහනම්කැලේ.
බස්නාහිරට: රත්ගඟ.

(3) කුකුළුකෝරළේ අයගම පිහිටි කැකුලම්දෙනිය අක්කර 4ක් සහ පාර්චස් 6ක් පමන විශාලකම ඇති ඉඩමට මායිම්:—

උතුරට: ගල්අමුනේදෙල සහ ඉදිකස්ගොඩැල්ලේ හේන් යාය.
නැගෙනහිරට: කැකුලම්දෙනිය.
දකුණට: කුකුලම්දෙනිය, අරම්බෙගම මලපාලවේ කැකුනේගහමුකලාන සහ ගල්අමුනේදෙල.
බස්නාහිරට: ගල්අමුනේදෙල.

(4) කුරුවිටිකෝරළේ හිඳුරන්ගල පිහිටි දිගින් දම්වැල් 10ක් පමණ විශාලකම ඇති මහදෙලට මායිම්:—

උතුරට: ගල්ලෙනයටවල.

නැගෙනහිරට : නො. 56 සිතියමේ ලොට් නො. 451.
දකුණට: මහඇල ගන්ඉම්මඇලට වැටෙනස්ථානය.
බස්නාහිරට : මහඇලේ දකුණ ඉවුර සහ 56ගේ සිතියමේ ලොට් නො. 450.

(5) කුරුවිටිකෝරළේ තෙප්පනාව ඉහලගම පිහිටි දික් දෙනිය ඉහලකැල්ල අක්කර 3, රූඩ් 2 සහ පර්චස් 5ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට : 279ගේ සිතියමේ ලොට් නො. 197 සහ 199.
නැගෙණහිරට : එම සිතියමේ ලොට් නො. 203.
දකුණට: එම සිතියමේ ලොට් නො. 201කේ ඉතුරු කොටස.
බස්නාහිරට : එම සිතියමේ ලොට් 200 සහ තෙප්පනාව මැදගම ගම්මායිම.

(6) කුරුවිටිකෝරළේ තෙප්පනාව ඉහලගම පිහිටි දික් දෙනිය ඉහලකැල්ල අක්කර 3, රූඩ් 2 සහ පර්චස් 30ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට : 279ගේ සිතියමේ නො. 201කේ ඉතුරු කොටස.
නැගෙනහිරට : එම සිතියමේ නො. 202 සහ 203.
දකුණට; 279ගේ සිතියමේ නො. 201කේ ඉතුරු කොටස.
බස්නාහිරට : තෙප්පනාව මැදගම ගම්මායිම සහ ලොට් නො. 200.

(7) කුකුළුකෝරළේ ඕබාක්කේ පිහිටි දිගින් දම්වැල් 7ක් සහ පලලින් දම්වැල් 1ක්ද විශාලකම ඇති කොස්වතු ගහව මායිම් :—

උතුරට : නො. 247කේ සිතියමේ ලොට් නො. 20.
නැගෙනහිරට : කරව්වනේඇල කොස්වතුගහට වැටෙන ස්ථානය.
දකුණට : නො. 247ක සිතියමේ ලොට් නො. 66A.
බස්නාහිරට: ගුලනේඇල කොස්වතුගහට වැටෙනස්ථානය.

(8) කුකුළුකෝරළේ දෙල්ගොඩ පිහිටි බලිපොලේහේන (ලොට් 1–CL[1]) අක්කර 3½ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට : කැරම්ල්ලඇල සහ පිටඇල.
නැගෙනහිරට : නො. 1 සිතියමේ ලොට් 1–CLකේ ඉතුරු කොටස.
දකුණට : කැරම්ල්ලඇල සහ ලොට් 1–CC.
බස්නාහිරට : ලොට් 1–CLකේ ඉතුරු කොටස.

(9) කුකුළුකෝරළේ දෙල්ගොඩ පිහිටි බලිපොලේහේන (ලොට් 1–CL[2]) අක්කර 3½ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට, නැගෙණහිරට සහ දකුණටද : නො. 1කේ සිතියමේ ලොට් 1–CLකේ ඉතුරු කොටස.
බස්නාහිරට : කැරම්ල්ලඇල.

(10) කුකුළුකෝරළේ දෙල්ගොඩ පිහිටි බලිපොලේහේන (ලොට් 1–CL[3]) අක්කර 3ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට සහ නැගෙණහිරට : නො. 1 සිතියමේ ලොට් 1–CLකේ ඉතුරු කොටස.
දකුණට : දබලඇල.
බස්නාහිරට : කැරම්ල්ලඇල.

(11) කුරුවිටිකෝරළේ කහහේන්ගම පිහිටි පොල්අවු ගොඩිමූකලාන අක්කර 4ක් සහ පර්චස් 11ක් පමණ විශාලකම ඇති ඉඩමට මායිම් :—

උතුරට : නො. 227කේ සිතියමේ ලොට් 178.
නැගෙණහිරට : එම සිතියමේ ලොට් 188.
දකුණට : ගර්කාගම ගම්මායිම.
බස්නාහිරට : නො. 227කේ සිතියමේ ලොට් නො. 173, 171 සහ 175.

(12) කුරුවිටිකෝරළේ ඇල්ලේකන්ද සහ ගිලීමලේ පිහිටි දිගින් දම්වැල් 40ක් පමණ විශාලකම ඇති අඹගහකුඹුරේ ඇලට මායිම් :—

උතුරට : ගෙදරගාවාඇලමෝදර.
නැගෙණහිරට : වම්ඉවුර.
දකුණට : අඹගහකුඹුර.
බස්නාහිරට : දකුණු ඉවුර.

ජේ. ආර්. හැලොක්,
සබරගමු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 6වෙනි දින
රත්නපුරේ කච්චේරියේදිය.

---

## දැන්වීමයි.

බස්නාහිර පලාතේ කොළඹ සහ මීගොමු දිස්ත්‍රික්කු සීමා තුල පිස්සුබල්ලු රෝගයෙන් අන්තරාය දහට ඇති බව වර්ෂ 1930ගේ නොවැම්බර 17කේ සහ වර්ෂ 1929ගේ නොවැම්බර 6ගේ ආඥාපණත්වලින් අර්ත්වැඩියාකරණලද වර්ෂ 1893ගේ පිස්සු බලු ආඥාපණතේ 10A වගන්තියේ ප්‍රකාර මට ලැබී තිබෙන බලය පරිදි මෙයින් ප්‍රකාශකරමි. බැද නොසිටිනා හෝ කෙනෙකුන් විසින් ලනුවක හෝ දම්වැලක ආධාරයෙන් ගෙනයනු නොලබන යම් කිසි බල්ලෙක් ප්‍රසිද්ධ ස්ථානයකදී නොහොත් පාරකදී සම්භවුවහොත් ඌ විනාශකර දමනු ලැබේ.

ආර්. එච්. වෙට්හෝන්,
බස්නාහිර පලාතේ දිසාපති තුමා.

වර්ෂ 1936ක්වූ ජනවාරි මස 7වෙනි
දින කොළඹ කච්චේරියේදිය.

---

## අන්‍ය දැන්වීම.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ කදුරුපොකුණේ පදිංචි කුමාරසිංහ වන්නිආරච්චිගේ දෙන් නිකුලස් වන මම ගාල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් පත්කරණු පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගියතැනදී රිජිස්ට්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලුම්කරණබව 1907වන වර්ෂයේ අංක 1 දරණ ආඥාපණතේ 1B දරණ උපලෙඛනයේ දෙවෙනි නියොගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි

27. 12. 1935. ඩී. ඇන්. ඩබ්ලිව්. කුමාරසිංහ.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.